# FOREIGN FINANCE
# (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# ගෙවුම් තුලන ලේඛනය / ගෙවුම් ශේෂ ලේඛනය

ශ්‍රී ලංකාව 2013 වර්ෂයේ සිට නව ආකෘතියට අනුව ගෙවුම් තුලන ලේඛනය / ගෙවුම් ශේෂ ලේඛනය පිළියෙළ කිරීමට පියවර ගෙන ඇත.

ගෙවුම් තුලන ලේඛනය / ගෙවුම් ශේෂ ලේඛනය යනු වර්ෂයක කාල පරිච්ඡේදයක් තුළ රටක් විසින් සෙසු ලෝකය සමඟ කරන ලද ආර්ථික ගනුදෙනු හේතුවෙන් වෙනත් රටවලින් ලැබෙන විදේශ මුදල් හා විදේශ රටවලට ගෙවන විදේශ මුදල් හා ඒවා අතර වෙනස තුලනය කරන ආකාරය දක්වන ලේඛනයකි.

මෙමගින් කිසියම් රටක් නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදු වන සියලු ආර්ථික ගනුදෙනු ක්‍රමානුකූල ව ද්විත්ව ගිණුම්කරණ මූලධර්මය මත සටහන් කෙරේ.

ගෙවුම් තුලන ලේඛනයක ඇතුළත් කරන ගනුදෙනු වාර්තා කිරීමේදී අනුගමනය කරන මූලික සම්මතය වනුයේ සෑම ගනුදෙනුවක් ම එක හා සමාන වටිනාකමින් දෙතැනක සටහන් කළ යුතු වීම යි.

Class Work.LK

මෙම ගනුදෙනු සටහන් කිරීමේ දී සෑම ගනුදෙනුවකට ම වටිනාකම හර අගයක් සහ බැර අගයක් වශයෙන් තීරු දෙකක සටහන් කළ යුතු අතර බැර වටිනාකම (+) ලකුණින් සහ හර වටිනාකම (-) ලකුණින් සටහන් කළ යුතු වේ.

මෙලෙස ගෙවුම් තුලන ලේඛනයේ ඇතුළත් සියලු ම ගනුදෙනු සමාන අගයකින් බැර තීරුවක සහ හර තීරුවක සටහන් කළ විට සියලු ගනුදෙනුවල ශුද්ධ ශේෂය ශූන්‍ය අගයක් ගනී. "ගෙවුම් තුලන ලේඛනය සෑම විට ම තුලනය වේ" යනුවෙන් අදහස් වන්නේ මෙය යි.

ගෙවුම් තුලන ලේඛනයේ "හර" සහ "බැර" අගයන් වෙන් වෙන් ව සටහන් කිරීමේ දී මූලධර්ම දෙකක් අනුගමනය කළ යුතු ය.

ClassWork.LK

# <u>ගෙවුම් තුලන ලේඛනයේ සටහන් කිරීමේ මූලධර්ම</u>

භාණ්ඩයක් / සේවාවක් / වත්කමක් තම රටෙන් වෙනත් රටකට බැහැර වන විට එම අයිතමයේ වටිනාකම බැර වටිනාකමක් (+) ලෙස සටහන් කළ යුතු වේ.

**නිදසුන් :** ශ්‍රී ලංකාවේ ඇගලුම් අපනයන කළ විට එම වටිනාකම ජංගම ගිණුමේ බැර සටහනක් ලෙස ඇතුළත් කළ යුතු වේ.

භාණ්ඩයක් / සේවාවක් / වත්කමක් තම රටට වෙනත් රටකින් ලැබෙන විට එම අයිතමයේ වටිනාකම හර වටිනාකමක් (-) ලෙස සටහන් කළ යුතු වේ.

**නිදසුන් :** ශ්‍රී ලංකාවට මැද පෙරදිග රටකින් ඛනිජ තෙල් ආනයනය කළ විට එම වටිනාකම ජංගම ගිණුමේ හර සටහනක් ලෙස ඇතුළත් කළ යුතු වේ.

ClassWork.LK

# ගෙවුම් තුලන ලේඛනයේ ඇතුළත් ගනුදෙනු

නව ආකෘතියට අනුව ගෙවුම් තුලන ලේඛනයේ ඇතුළත් ගනුදෙනු පස් වැදැරුම් වේ. එනම්,

- භාණ්ඩ සහ සේවා අපනයනය කිරිම සහ ආනයනය කිරිමට අදාළ ගනුදෙනු
- ආදායම් ලැබීම හා ගෙවීම ආශ්‍රිත ගනුදෙනු
- වත්කම්, ධනය, ත්‍යාග වැනි දෑ පිළිබඳ ව ඒක පාර්ශ්වීය ව සිදු කරන ගනුදෙනු
- නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් හිමි කර ගැනීම හා විකිණීම ආශ්‍රිත ගනුදෙනු
- මූල්‍ය වත්කම් හිමි කර ගැනීම හා විකිණීම ආශ්‍රිත ගනුදෙනු

ClassWork.LK

# ගනුදෙනුවල ස්වභාවයන් අනුව ගෙවුම් තුලන ලේඛනයේ ගිණුම්

ගනුදෙනුවල ස්වභාවයන් අනුව ගෙවුම් තුලන ලේඛනයේ නව ආකෘතියට අනුව එහි ප්‍රධාන ගිණුම් 3 කි.

- ජංගම ගිණුම
- ප්‍රාග්ධන ගිණුම
- මූල්‍ය ගිණුම

## ජංගම ගිණුම

ජංගම ගිණුම නැවත කොටස් තුනකි. එනම්,

- භාණ්ඩ හා සේවා ගිණුම
    - **භාණ්ඩ ගිණුම**
    - **සේවා ගිණුම**
- ප්‍රාථමික ආදායම් ගිණුම
- ද්විතීයක ආදායම් ගිණුම

ClassWork.LK

# භාණ්ඩ ගිණුම

ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම සම්බන්ධ ගනුදෙනු කිහිපයකට නිදසුන් පහත දැක්වේ.

- ✓ ශ්‍රී ලංකාවේ ඇගලුම් සමාගමක් මිලියන 500ක් වටිනා ඇගලුම් තොගයක් අපනයනය කිරීම
- ✓ ජපානයේ මෝටර් රථ සමාගමකින් මිලියන 1000ක් වටිනා මෝටර් රථ ආනයනය කිරීම

මෙම නිදසුන සම්බන්ධ ගනුදෙනුව භාණ්ඩ ගිණුමට ඇතුළත් වේ.

ලෝකයේ එක් රටක් සෙසු රටවල් සමඟ සිදු කරන භාණ්ඩ අපනයන හා ආනයන පිළිබඳ ව සටහන් කරන ගිණුම භාණ්ඩ ගිණුම හෙවත් වෙළෙඳ ගිණුම ලෙස හැඳින්වේ.

මෙම වෙළෙඳ ගිණුමේ ශේෂය වෙළෙඳ ශේෂය ලෙස හඳුන්වයි. දෘශ්‍ය භාණ්ඩ ගිණුමේ ශේෂය ලෙස ද එය හඳුන්වයි.

ClassWork.LK

**වෙළෙඳ ශේෂය = භාණ්ඩ අපනයනය - භාණ්ඩ ආනයනය**

**නිදසුන :** -500 = ඇගලුම් අපනයනය 500 - ඇගලුම් ආනයනය 1000 (ඩොලර් මිලියන)

වෙළෙඳ ගිණුමේ ශේෂය අතිරික්තයක් හෝ (+) හිඟයක් හෝ (-) විය හැකි ය.

ඉහත නිදසුන අනුව වෙළෙඳ ගිණුමේ ශේෂය සෘණ අගයකි.

ClassWork.LK

## සේවා ගිණුම

අන්තර්ජාතික වෙළෙඳාමේ දී රටක් අනෙකුත් රටවල් සමඟ සාධක නොවන සේවා සඳහා කරනු ලබන වියදම් සහ ලැබෙන ආදායම් සටහන් කරන ගිණුම සේවා ගිණුම වේ.

## සේවා ගිණුමට අයත් සංරචක

- සංචාරක සේවා
- මුහුදු ප්‍රවාහණ
- ගුවන් ප්‍රවාහණ
- මූල්‍ය සේවා
- විදුලි සන්දේශ සේවා
- රක්ෂණ සේවා

ClassWork.LK

**සේවා ගිණුමේ ශේෂය = සේවා අපනයන ආදායම - සේවා ආනයන වියදම**

සේවා ගිණුමේ ශේෂය අතිරික්තයක් (+) හෝ හිඟයක් (-) විය හැකි ය.

## භාණ්ඩ හා සේවා ගිණුම

භාණ්ඩ ගිණුමේ ශේෂය සේවා ගිණුමේ ශේෂය ගැලපීමෙන් භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය ලැබේ.

**භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය = භාණ්ඩ ගිණුමේ ශේෂය + සේවා ගිණුමේ ශේෂය**

ClassWork.LK

# ප්‍රාථමික ආදායම් ගිණුම

ප්‍රාථමික ආදායම ගිණුමට ඇතුළත් වන්නේ නිෂ්පාදන ක්‍රියාවලිය ආශ්‍රයෙන් පැන නගින පොළී, වැටුප් හා මූල්‍ය වත්කම් ආයෝජනයෙන් උපයා ගන්නා ලාභාංශ ආදිය යි.

ශ්‍රී ලංකාවේ විදේශ ගනුදෙනු සම්බන්ධ නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

- ශ්‍රී ලංකාවේ විදේශීය රටවලින් ලබා ගත් ණය සඳහා වාර්ෂික පොළිය මිලියන 500ක් ගෙවීම
- ශ්‍රී ලාංකික සමාගමක් මාලදිවයිනේ ඇඟලුම් කම්හලක ආයෝජනයෙන් මිලියන 300ක් ලාභාංශ ලැබීම.

මෙම නිදසුන් සම්බන්ධ ගනුදෙනු ගෙවුම් තුලන ලේඛනයේ ප්‍රාථමික ආදායම් ගිණුමට ඇතුළත් වේ.

| |
|---|
| **ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය = විදේශ සාධක ලැබීම් - විදේශ සාධක ගෙවීම්** |

**නිදසුන :** (-200) = විදේශ සාධක ලැබීම් 300 - විදේශ සාධක ගෙවීම් 500 (ඩොලර් මිලියන)

Class Work LK

## ද්විතීයක ආදායම් ගිණුම

ශ්‍රී ලංකාවේ නේවාසිකයන් සහ අනේවාසිකයන් අතර සිදුවන ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

- මැදපෙරදිග සේවය කරන ලාංකිකයන් තම ඥාතීන්ට මිලියන 1500ක ප්‍රේෂණ වශයෙන් වාණිජ බැංකුව වෙත එවීම.

- ශ්‍රී ලංකාවේ චීන ජාතිකයන් තම ඥාතීන් වෙත මිලියන 500ක ප්‍රේශණ චීනයේ බැංකුවක් වෙත යැවීම.

**ද්විතීයක ආදායම් ගිණුමේ ශේෂය = විදේශ සංක්‍රාම ලැබීම් - විදේශ සංක්‍රාම ගෙවීම්**

**නිදසුන් ඃ** 1000 = විදේශ සංක්‍රාම ලැබීම් 1500 - විදේශ සංක්‍රාම ගෙවීම් 500 (ඩොලර් මිලියන)

Classwork.LK

ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුමට ඇතුළත් භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය, ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය හා ද්විතීයක ආදායම් ගිණුමේ ශේෂය ගැලපීමෙන් ජංගම ගිණුමේ ශේෂය ලැබේ.

| | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| **භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය** | 500 | 1000 | - 500 |
| **ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය** | 300 | 500 | - 200 |
| **ද්විතීයක ආදායම් ගිණුමේ ශේෂය** | 1000 | 500 | 500 |
| **ජංගම ගිණුමේ ශේෂය** | | | - 200 |

ClassWork.LK

## ප්‍රාග්ධන ගිණුම

මූල්‍ය වත්කම් මූල්‍ය ගිණුම තුළ ඇතුළත් වන අතර නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් ප්‍රාග්ධන ගිණුමේ සටහන් කරනු ලැබේ.

නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් හි නේවාසිකයන් සහ අනේවාසිකයන් අතර සිදු වන ගනුදෙනු ප්‍රාග්ධන ගිණුමේ හර - බැර ලෙස සටහන් වේ.

ClassWork.LK

# <u>නිෂ්පාදනය නොකළ මූල්‍ය වත්කම්</u>

නිෂ්පාදනය නොකළ මූල්‍ය වත්කම් කිහිපයක් පහත දැක්වේ.

- බලපත්‍ර
- බදු ගිවිසුම්
- සන්නම්
- කීර්තිනාමය විකිණීම / මිල දී ගැනීම
- තානාපති කාර්යාලයකට ඉඩම් විකිණීම
- ජාත්‍යන්තර ආයතන / රජයෙන් ලබා දෙන ප්‍රදාන
- පේටන්ට් බලපත්‍ර (ස්වාධිකාරී අයිතිය)
- පුරස්කාර

ClassWork.LK

# <u>මූල්‍ය ගිණුම</u>

ගෙවුම් තුලන ලේඛනයේ අවසාන උප ගිණුම මූල්‍ය ගිණුමයි.

නේවාසිකයින් සහ අනේවාසිකයින් අතර සිදු වන මූල්‍ය වත්කම් හා වගකීම් ආශ්‍රිත ගනුදෙනු මූල්‍ය ගිණුමෙහි වාර්තා කෙරේ.

## <u>මූල්‍ය ගිණුමේ ගනුදෙනු වර්ග</u>

කාර්යාත්මක ස්වරූපය මත මූල්‍ය ගිණුමේ ගනුදෙනු ප්‍රධාන වශයෙන් කොටස් පහකට බෙදිය හැකි ය. එනම්,

- සෘජු ආයෝජන
- කලඹ ආයෝජන
- මූල්‍ය ව්‍යුත්පන්න
- වෙනත් ආයෝජන
- විදේශ සංචිත වත්කම්

ClassWork.LK

කිසියම් රටක ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුම සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂවල එකතුව, එම රට අවශේෂ ලෝකය සමඟ ශුද්ධ ණය හිමියෙක් ද (ගෙවුම් තුලන අතිරික්තයක්) නැතහොත් ශුද්ධ ණය ගැතියෙක් ද (ගෙවුම් තුලන හිඟයක්) ද යන්න පෙන්නුම් කරයි.

ද්විත්ව ගිණුම් මූලධර්මයට අනුව ජංගම සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂවල එකතුව, මූල්‍ය ගිණුමේ ශේෂයට සමාන විය යුතු අතර කිසියම් සංඛ්‍යානමය වරදක් නිසා අසමානතාවක් හටගතහොත් "ශුද්ධ වැරදීම් හා අත්හැරීම්" යන අයිතමය යොදා ගනිමින් එම සමානත්වය ඇති කෙරේ.

මූල්‍ය ගිණුම මඟින් පෙන්වා දෙන්නේ රටක ශුද්ධ ණයහිමි බව හෝ ශුද්ධ ණය ගැතිබව මූල්‍යනකරණය කෙරෙන ආකාරයයි.

ClassWork.LK

ගෙවුම් තුලන ලේඛනයේ එක් එක් ගිණුම්වලට අයත් අයිතමයන් කල්පිත සංඛ්‍යා ලේඛන ඇතුළත් කර ඉදිරිපත් කළ හැකි ය.

(රු. මිලියන)

| අයිතම | බැර | හර |
|---|---|---|
| වෙළෙඳ ගිණුම | | |
| අපනයනය | 1000 | |
| ආනයනය | | 1300 |
| මූල්‍ය නොවන රත්රන් ලැබීම් | 150 | |
| මූල්‍ය නොවන රත්රන් ගෙවීම් | | 200 |
| සේවා ගිණුම | | |
| ලැබීම් | 800 | |
| ගෙවීම් | | 600 |
| භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය | | (150) |
| ප්‍රාථමික ආදායම් ගිණුම | | |
| ලැබීම් | 800 | |
| ගෙවීම් | | 1000 |
| ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය | | 200 |
| ද්විතීයක ආදායම් ගිණුම | | |
| සේවා නියුක්ති ප්‍රේෂණ ලැබීම් | 1800 | |
| සේවා නියුක්ති ප්‍රේෂණ ගෙවීම් | | 800 |
| රජයේ සංක්‍රාම ලැබීම් | 400 | |
| ද්විතීයක ආදායම් ගිණුමේ ශේෂය | 1400 | |
| ජංගම ගිණුමේ ශේෂය | 1050 | |

ClassWork.LK

| අයිතම | බැර | හර |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | | |
| ප්‍රාග්ධන ගිණුම - ලැබීම් | 600 | |
| ප්‍රාග්ධන ගිණුම - ගෙවීම් | | 300 |
| ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | 300 | |
| ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | 1350 | |
| මූල්‍ය ගිණුම | | |
| ඍජු ආයෝජන : වත්කම් | 150 | |
| ඍජු ආයෝජන : වගකීම් | | 100 |
| විවිධ ආයෝජන : වත්කම් | 200 | |
| විවිධ ආයෝජන : වගකීම් | | 150 |
| අනෙක් ආයෝජන : වත්කම් | 150 | |
| අනෙක් ආයෝජන : වගකීම් | | 50 |
| සංචිත වත්කම් (ශුද්ධ) | 250 | |
| මූල්‍ය ගිණුමේ ශේෂය | 450 | |

ඉහත කල්පිත ගෙවුම් තුලන ලෙඛනයේ ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේසය රු.මි. 1350ක් වන අතර මූල්‍ය ගිණුමේ ශේෂය රු. මි. 450ක් වේ.

ද්විත්ව සටහන් මූලධර්මය අනුව ඉහත ශේෂ දෙක සමාන විය යුතු ය. මේ නිසා ශුද්ධ වැරදීම් හා අත්හැරීම් රු.මි. 900 ක් ලෙස ගෙන ඉහත ශේෂ දෙක සමාන කළ හැකි ය.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura